# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2261/58 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙම නියමය මගින් 2020 ඔක්තෝබර් මස 26 දිනැති අංක 2199/2 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ පළ කළ නියමය, එම නියමයේ (ග) උපඡේදය පහත උපඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

(ග) සෞඛ්‍යය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිර්දේශ කර මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද පරිදි, යම් වසංගත තත්ත්වයක් හෝ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන හදිසි තත්ත්වයක් හමුවේ කටයුතු කිරීමට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය වන්නා වූ ද යම් රජයේ රෝහලකට හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද්දා වූ ද වෛද්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර, තාක්ෂණික උපකරණ, උපාංග සහ ඒවායෙ කොටස්, රෝහල් ගෘහ භාණ්ඩ, ඖෂධ සහ රසායනික ද්‍රව්‍ය.

මෙම නියමය 2022 ජනවාරි මස 06 වැනි දින සිට බලපැවැත්වේ.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2022 ජනවාරි මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

EOG 01- 0153